# විප්‍රවාසී කෙටි කතාකරුවෝ



## කස්තිරම

### ඩී බී කුරුප්පු

සිංහල ඕස්ට්‍රේලියානුවන්ගේ කෙටි කතා සංග්‍රහ දෙකක් දෑනට නිකුත් වී ඇත. 'තිරස තරණ' නමින් කෙටිකතා පහළොවකින් සමන්විත සංග්‍රහයක් නිව් සවුත් වේල්ස් සිංහල සංස්කෘතික හමුව විසින් පළ කරන ලද්දේ මේ වසරේ ය. එය සංස්කරණය කරන ලද්දේ රසික සූරියආරච්චි විසින් ය. පළමුවැනි කෙටි කතා සංග්‍රහය වූයේ 2007 දී එළි දක්වන ලද 'පළමුවැනි තෑග්ග' කෙටි කතා එකතුව ය. 2006 දී 'සන්නස' මාසිකය විසින් පවත්වන ලද කෙටි කතා තරගයෙන් තෝරා ගන්නා ලද නිර්මාණ දහයක් එයට ඇතුළත් ය. 'තිරස තරණ' එකතුවේ එක් කතාවක් හැරෙන්නට අනික් ඒවා මෙම සංග්‍රහය වෙනුවෙන්ම ලියූ බව පෙනෙයි. එකක් පමණක් 2005 දී පිට වූ කෙටිකතා පොතකින් ගන්නා ලද්දකි.

මේ රටේ නොහොත් වෙනත් විදේශයක සිට සිංහලයන් ලියන පොත පත ශ්‍රී ලංකාවේ පාඨකයන් ද අරමුණු කොට ගෙන ලිවිය යුතු යයි සිතමි. එසේ නොවුව හොත් පනහක් හැටකට වඩා අලෙවි කර ගැනීම දුෂ්කර වන නිසා ය. අනෙක් අතට සීමිත පාඨක පිරිසක් සඳහා මෙතරම් වෙහෙසක් ගැනීමේ තේරුමක් ද නැත. මෙම කරුණු නිසා අප වාසය කරන දේශයේ වට පිටාව ජනතාව සහ අපගේම උදවිය ගෙවන දිවිය ද ඇසුරෙන් කරන නිර්මාණ ඔස්සේ මව් බිමේ පාඨකයන් වෙත අලුත් යමක් පිරිනැමීමට ද අපි සමත් වන්නෙමු.

මේ රටේ නොහොත් වෙනත් විදේශයක සිට සිංහලයන් ලියන පොත පත ශ්‍රී ලංකාවේ පාඨකයන් ද අරමුණු කොට ගෙන ලිවිය යුතු යයි සිතමි. එසේ නොවුව හොත් පනහක් හැටකට වඩා අලෙවි කර ගැනීම දුෂ්කර වන නිසා ය. අනෙක් අතට සීමිත පාඨක පිරිසක් සඳහා මෙතරම් වෙහෙසක් ගැනීමේ තේරුමක් ද නැත. මෙම කුරුනු නිසා අප වාසය කරන දේශයේ වට පිටාව ජනතාව සහ අපගේම උදවිය ගෙවන දිවිය ද ඇසුරෙන් කරන නිර්මාණ ඔස්සේ මව් බිමේ පාඨකයන් වෙත අලුත් යමක් පිරිනැමීමට ද අපි සමත් වන්නෙමු.

ශ්‍රියානි පෙරේරා පුෂ්පිකා ගමගේ සහ සුභාෂිනී හේරත් යන ලේඛිකාවන් තිදෙනාගේ කෙටි කතා යට කී සංග්‍රහ දෙකටම ඇතුළත් වීම වෙසෙසා සඳහන් කළ යුත්තකි. පළමුවැනි තෑග්ග සංග්‍රහයේ එන කෙටි කතා අතරින් මෙරට දිවියට කෙළින්ම සම්බන්ධ ප්‍රවෘත්ති රැගත් කතා ඇත්තේ හතරක් පමණි. 'තිරස තරණ' එකතුවේ කතා එකොළහක් ම මෙරට දිවියට සම්බන්ධ වූ නිමැවුම් වීම අගය කළ යුතු යයි සිතමි. ලක්ෂ්මන් කොඩිතුවක්කු ගේ 'කොස් ඇට මීයා' නම් වූ නිර්මාණය මෙම රට පසු බිම් කොට ගත්තෙකැයි කිව හැකි වුව ද මෙරට දිවිය ගැන විශේෂ යමක් මතු කරන්නක් නොවේ. කළින් පල කැරුණු කෙටි කතා සංග්‍රහයක් වන පියසේන පියසිරි ගේ 'රටකින් එහා' එකතුවේ එන 'උත්තම පුරුෂයා' ද මෙරටට කෙළින්ම සම්බන්ධ නොවේ. එම කතාවේ වැදගැම්ම ගැන වෙනම සළකා බැලිය යුතු යයි සිතමි.

චමිලා කොතලාවල ලියූ 'පශ්චත්තාපය' ගැඹුරු චරිත විමර්ශනයකට අවසරයක් පාදන පුවතක් සැකෙවින් කියන්නක් ලෙසිනි මා දුටුවේ. සමන් මහානාම දිසානායක ගේ ''දෙව් ලොව ගමන' ද කතාවක ප්‍රවේශයක තත්වයෙන් ඔබ්බට වර්ධනය නොවන සැටියක් පළ කරන්නේ ය. ෂෙල්ටන් පීරිස් ගේ 'සිඩ්නි පුරයට ශිෂ්‍යත්වයක්' අවස්ථා ගණනාවක් වාර්තා කිරීමක් මුත් කෙටි කතාවක් වශයෙන් ගොනු නොවූවක තත්වයේ පවතින්නකි. උඩගේ වික්‍රමසේනගේ 'අමුත්තන් මැද' නම් කෙටි කතාව ද විවිධ කරුණු ගැන මත ප්‍රකාශයක තත්වයෙන් එහාට නොයන පාට ය. රසික සූරියආරච්චි ලියූ 'ආගන්තුක සත්කාරය' ද එම ලක්ෂණය නිසා ම කෙටි කතාවක් ලෙසින් වර්ධනය නොවූ තත්වයක ඇත.

සමන් දිසානායක ගේ 'දෙව් ලොව ගමන' නම් කතාවෙන් ඉදිරිපත් කරන්නට තැත් කරන සම්පූර්ණ අදහස සාර්ථක ලෙසින් ඉදිරිපත් කරන්නක් ලෙසින් ශ්‍රියානි පෙරේරා ගේ 'පාරාදීසය' (පළමුවැනි තෑග්ග කෙටි කතා සංග්‍රහයේ) දැක්විය හැකි ය. ඇය විසින්ම 'තිරස තරණ' ට ලියන ලද කෙටි කතාව ඊට වඩා සංකීර්ණ වූවකි. එතෙර මෙතෙර දෙක්හි දී වැඩි විය පත් දරුවන්ගේ පෙම් සබඳතා හා දිවි පැවැත්ම කෙරෙහි දෙමාපියන්ගේ ආකල්ප සහ එයට ඔරොත්තු දීමට ඔවුන්ට සිදුවන ආකාරය ද නිරූපණය කරන්නකි.

සුනිල් ගෝවින්න ලියූ 'කලු කෙස් කළඹ' සුදු දූරියන් අතරට යන කලු දූරියකට මුහුණ පෑමට සිදුවන වෙනස්කම් හා විරෝධය ඉදිරියේ පියා කම්පාවට පත් වන අතර එම දූරිය සාර්ථක ලෙසඑ යට මුහුණ දීම කියන්නකි. මලී දිසානායක ගේ 'කෙටියෙන් කියන කතාවක්' මේ රටේ ජීවිතය හැඩ ගැසෙන්නේ මිතුරු මිතුරියන්ගෙන් පමණක් නොව තමාගේ ම පවුලේ අයගෙන් පවා ඇත් වන සැටි කියාපාන්නකි.

ලක්ෂ්මන් රත්දෙණිය ගේ 'කප් සුවහස් කල් පෙරුම් පුරාගෙන' මෙරටට සංක්‍රමණය කරන තරුණ යුවලක් මුහුණ පාන පවුල් ගැටලු හා ආර්ථික දුෂ්කරතා පිළිබිඹු කරන්නකි. කොයි තරම් නැති බැරි කම් තිබුණත් බර වියදමක් කරගෙන ගම රට නෑදෑයන් බලන්නට යාමද අවශ්‍ය ම ය. යුරේකා ඉනෝමලී ප්‍රනාන්දු ගේ 'සත් දිනෙන් මොහොතක්' ද එම ගැටලුව ම කියන්නකි. ජීවන බර නිසා කුඩා දරුවන් සිටිය දී වුව රැකියාවක නිරත වන්නට සිදුවන මවගේ කටුක දිවිය කියන කතාව අසම්පූර්ණ ස්වභාවයකින් යුක්ත ය.

සුභාෂිනී හේරත් ලියූ 'අපේ කාලයේ කතාවක්' මෙහි එන දෙමාපියන්ගේ ලොකුම බලාපොරොත්තුව - එනම් දූ දරුවන්ට හොඳින් උගන්වා ලොකු උදවිය කිරීම - නිසා ම ඇති වන ගැටුම් හා බලාපොරොත්තු සුන්වීම් කියාපාන්නකි. ඒ කිසිවකින් බිඳලිය නොහැකි අන්‍යෝන්‍ය බැඳීම් නිසා ඇද නොවැටෙන පවුලක් ගැන ය ඇය ලියන්නේ. පුෂ්පිකා ගමගේ ලියන 'අහිමි වූ සෙනෙහස' විසිරෙන පවුලක් ගැන ය. පෙමින් බැඳී විවාහ වී ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ අඹු සැමි යුවලම රැකියාවේ නිරතවී සිටීම නිසා එකිනෙකාගෙන් දුරස් වන පුවත ය එයින් කියැවෙන්නේ.

දූරියක මල්වර වීම නිමිත්තෙන් පවත්වන උත්සවයක් නිමිති කොට ගෙන යුවලක් අතර ඇති වන සංවාදයක් - මත ගැටුම - ඔස්සේ විලාසිතාවක් හැටියට පැරණි චාරිත්‍ර වාරිත්‍ර අනුගමනය කිරීම උපහාසයට ලක් කරන්නක් ලෙසින් ශ්‍යාමා රත්නායක ලියූ 'සිරිත් විරිත්' නම් කෙටි කතාව හඳුන්වමි.

එම කතා එකතුවේ එන 'උත්තම පුරුෂයා' කලින් පල කරන ලද්දක් බව කළින් සඳහන් කළෙමි. එම කතාව ලියූ පියසේන පට්ටිආරච්චි 'රටකින් එහා' නම් වූ කෙටි කතා එකතුවේ පෙනී සිටින්නේ වෙනත් ස්වරූපයකිනි. එනම් පියසේන පියසිරි නමින් ය. පියසේන පියසිරිගේ කෙටි කතා සංග්‍රහයේ මෙරට දිවියේ විවිධ පැති කඩ දෙස සිහින් උපහාසයකින් බලන බැල්මක් දක්කට ඇත. ඔහුගේ කතා වල එන බස් වහර උපමා රූපක අතින් ද අනෙක් බොහෝ රචකයන්ගේ භාෂාවට වඩා පොහොසත් බව ද කිව යුතු ය. මේ අතින් සුවිශේෂ දක්ෂකමක් ප්‍රමිතා රෝහිණී ගේ කෙටි කතා හා කවි එකතුවක් වූ 'හිරුට මුවාවෙන්' නම් කෘතියේ - විශේෂයෙන් එහි එන 'හැර යාම' නම් කතාවේ - දක්නට ඇති බව කලින් ලිපියක සඳහන් කළෙමි. ඇය මෙරට දිවියේ හිතකර පක්ෂය දකින සැටි ද කීවෙමි.

පියසේන පියසිරි ගේ විමර්ශනයට ලක් වන මෙරට සිංහලයන් හා සුදු මිනිසුන් ඔහු අතින් නිරූපණය වන ආකාරය සැකෙවින් සඳහන් කළ යුතු යයි සිතමි. එක් අතකින් මෙහි එන වයිවාරන්න පුද්ගලයන්ගේ ගති සිරිත් හා වැඩ කටයුතු ඔහුගේ කතා වලට පදනම් වී ඇත. 'කිළිටි කබාය' පාඨකයාට සිහිපත් කරන්නේ ලන්ඩනයේ සෙල්ෆ්‍රිජස් සාප්පුවේ බඩු හොරකමට අසු වූ සරසවි ඇදුරා ය. කලකට උඩ දී තමාට ඉගැන්වූ මහාචාර්ය දිඹුලාගල ශාන්ත පාවුලු ලාබ බඩු කඩයට ගොස් පරණ කබාය ගලවා තබා අලුත් එකක් ඇඳගෙන පිටවන සැටි කියන්නේ සුපුරුදු උපහාසයෙන් ය.

'යළි උපන්නෝ' වසර පනහකට හැටකට උඩදී ශ්‍රී ලංකාවේ සුලබ සත්ව වර්ගයක් වූ අවංක නිලධාරීන්ගෙන් කෙනකු විශ්‍රාමිකයකු වශයෙන් මෙරටට පැමිණ ගත කරන දිවිය ගැන කියන්නකි. දූක සේ හම්බ කරගත් මුදලින් උගන්වා ඇති දූඩි කර දියණිය සමග මෙහි වාසය කරන්නට එන එම වයසක නිලධාරියා එල්ලයක් නැති මිනිසකුගේ තැනට වැටෙන්නේ ද?

'ගොඩ ගමයා' මව් බිමේ සිට එන තවත් කෙනෙකි. ඔහු කථකයාගේ නෑදෑයෙක් ද වන්නේ ය. ඔහුගේ පියා විසින් 'බල්ලා' යන අපර නාමයෙන් හඳුන්වනු ලැබූ ගොඩගමයාගේ මගඩි වැඩ වලට සිය බිරිය ද රැවටෙන සැටි ඔහුට පෙනෙයි. සායි බබා ඇදහීමටද පටන් ගන්නා ගොඩගමයා ඉක්මනින් ම පලා ගොස් පිටව යාම ඔහුට සැනසීමක් ද වෙයි.

'බව තරණය' අලුතෙන් මෙරටට ආ යුවලක් වෙතින් - විශේෂයෙන්ම භාර්යාව වෙතින් දිස්වන අසීමිත විජිගීශාව උපහාසයට ලක් කරන්නකි. 'අභිනිෂ්ක්‍රමණය' සුපුරුදු මාතෘකාවම ය. තමන් බලන්නට එන මවගේ කතාව ය. කතානායිකාව ශ්‍රියානි පෙරේරාගේ 'පාරාදීසයේ' සහ සමන් මහානාම දිසානායකගේ 'දෙව් ලොව ගමනේත්' කතාවට වඩා මෙරට සමාජයේ ඇසුරක් ලබන්නී ය. එහෙත් ගම රට අතහැර සිටීම වයසක උදවියට කරන්නට බැරි දෙයකි. ඇය යන්නේ ඒ නිසා ය.

පියසිරි පියසේන සුදු ඕස්ට්‍රේලියානුවන් ද සිය කතා වලට වස්තු කොට ගන්නේ ය. 'දුම් ගෙය' සුදු අය වැඩියෙන් සිටින කන්තෝරුවක දුම් බොන්නන්ගේ අත්දැකීමක් කියන්නකි. 'මද පවනක් සේ ළඳුනි' පහසුවෙන් ම මිනිසුන් මාරු කරන ගැහැනියකගේ දුක්බර අවසානය කියන්නකි. 'වැල්වටාරම්' අල්ලපු නිවසේ වාසය කරන සුදු පවුල සමග ඇති කරගන්නා සබඳතාව විස්තර කරන්නකි. 'අනාරාධනය' මෙරට දිවියට හැඩ ගැසීමේ දුෂ්කරතාවන් වක් මගින් කීමක් ලෙසිනි මා දකින්නේ. තමාට සමීපව සිටින කාර්යාල සගයාගේ ගෙට ගෙවදීමේ උත්සවයට ආරාධනාවක් නොලබාම ඔහුට සුබ පතන කාඩ් පතට අස්සන් කරන්නට සිදු වන අවස්ථාවක් එයින් ඉදිරිපත් වෙයි. 'සමු ගැනීම' නම් කතාවේ එන්නේ තවත් වටහා ගැනීමට අපහසු සුදු මිනිසෙකි. කාර්යාල සගයෙකි.

'සිහින කොදෙව්ව' මෙහි පදිංචියට එන මව් බිමේ සගයකුගේ කතාව කියන්නකි. අතේ දුරින් තබා ගත යුත්තකු වුව ද ඔහුගේ ඇරයුම මග හරින්නට බැරි නිසා නිවසට යන ගමනක් විස්තර කරන්නකි.

පියසේන පියසිරි ගේ රටකින් එහා' කෘතියේ එන 'කාපිරියා' වෙනත් අපරදිග රටකදී මුණ ගැසුණු අප්‍රිකානුවකු ගැන කතාවකි. මෙරට දිවියට කෙළින්ම සම්බන්ධ නොවූ අනෙක් කතා දෙක 'උත්තම පුරුෂයා' සහ 'මාතලී' ය

Lead Accounting & Taxation Services
Public Accountant and Registered Tax Agent

Refunds within 14 days
Tax Returns 2007

ශ්‍රී ලාංකික ඔබට සුහද සේවය

Services
- Individual/ Business/ Investment Property Tax Returns
- Accounting/ Bookkeeping
- Preparation of Business Activity Statements(BAS)
- Audit of Non-for-Profit Organization and Self-Managed Superannuation Funds
- Personal Service and Advice

L. A. Dayananda Wimalasiri PNA
B.Com, M.Com, M.Bus, Ad.Dip.Acct.

Office
1/1324 Centre Rd, Clayton 3169
TP 03 9544 4995
Fax 03 9544 4997

After Hours
7 Whitton Court, Rowville 3178
P/F 03 9755 7400
M 0402 846 676

leadtax@iprimus.com.au

NATIONAL INSTITUTE OF ACCOUNTANTS
PNA

Kusumsiri - Lead Design House 0430 112 088